# තුන් බෑ වත

"මහ රජාණෙනී, අපි වමේ තුන්බෑයෝ තවදුරටත් මේක ඉවසා සිටින්නට සූදානම් නෑ. වහාම මේක අහෝසි කළ යුතුයි. නැත්නම් අපිට දැඩි තීරණයක් ගන්න වෙනවා."

"මේක කිව්වේ?"
"මහාරාජ ධුරය"
"මොනව මොනව බොලව්?"

"එසේය මහ රජාණෙනි, මේ මහාරාජ ධුර ක්‍රමය රටට මහ විපත්තියක්. ජනතාවට හෙනයක්. අපිට කොරයක්. ඒ නිසා මේක වහාම අහෝසි කරලා එක් පුද්ගලයෙක් සතුව තියන බලය රාජ සභාවට පැවරිය යුතුයි."

"ආය පටන්ගත්තද කන්කරච්චලේ. වැහි කාලේ එනකොට උඹලගේ ඔය බැක බැක ගෑම අහලා දැන්නම් මට එපා වෙලා."



"මහ රජාණෙනි, මෙය විහිළුවක් යැයි නොසිතන්න. ප්‍රගතිශීලී කඳවුරේ අපි අතීතයේ අපෙන් වුණ වැරදි හදුනාගෙනයි දැන් ඉන්නේ. නොපමාවම මහාරාජ ධුරය අහෝසි කරන්න."
"නොකළොත්?"

"අපිට දැඩි තීරණයක් ගන්න වෙනවා. ඔබවහන්සේට සහාය දැක්වීම නතර කරන්න වෙනවා. ඔබවහන්සේ පරාජය කිරීමට ඉදිරිපත් වෙන විකල්ප ජොකියෙකුට සහාය දැක්වීමට වුවත් සිදුවිය හැකියි."
"අම්මපා?"

"එසේය මහ රජාණෙනි. ජනතාව වෙනුවෙන් ප්‍රගතිශීලි කඳවුරේ වමේ අපි ඉටුකළ යුතු ඓතිහාසික කාර්යභාරයක් තියනවා. අපි ඒ වෙනුවෙන් කැප වෙනවා."
"දවල්ද ?"

"පීඩිත ජනතාව වෙනුවෙන් ප්‍රතිපත්ති දේශපාලනයේ යෙදෙන අපට දවල්ද රෑද කියා වෙනසක් නැහැ."

"බොහෝම හොදයි. අන්න ඒ වගේ ඍජු ප්‍රතිපත්ති තියන මිනිස්සු තමයි රජකමටත් සුදුසු. එහෙම නම් ඔය අස්ස කරත්ත මාලිගාවට බාරදීලා ගිහින් ජනතාවට එකතුවෙනු. මම මහා රාජ ධුරය අහෝසි නොකරන බව ජනතාවට කියා හැකිනම් මා පරාජය කරනු."
"ර...ර...ර...රජතුමනි, අ...අ...අ...අශ්ව කරත්තය කිව්වේ?"

"අශ්ව කරත්තය කීවේ රාජ සේවය පිණිස තොපිට ලබාදී ඇති අශ්ව කරත්ත හැර අන් කවරක්ද?. පරිවාර රථත් සමග ඒවා වහාම මාලිගාවට බාර දෙනු. ඒ සමඟම රාජ සේවයට කිරීම වෙනුවෙන් ලබාදී ඇති නිල නිවාසය, කාර්යාල උපකරණ ආදි සියල්ලත් මාලිගාවට බාරදෙනු. ප්‍රගතිශීලී කඳවුරේ ඓතිහාසික ජනතා මෙහෙවර කිරීමට විවේකය අවශ්‍ය බැවින් තොපේ ඥාති හිතමිත්‍රාදීන් මෙතෙක් දැරූ රාජ සේවයේ සියළු තනතුරු අද මධ්‍යම රාත්‍රියේ සිට අහෝසි කෙරෙනවා."

"හත්වලාමේ ඒ මොන වින්නැහියක්ද මහරජාණෙනි ඒ?"

"ඇයි තට මතක නැත්ද මම කීවා මහා රාජ ධුරය අහෝසි




නොකරන
බව. මගේ දිවි ඇති තෙක් බම්බුදීපයේ මහාරාජ මම වෙමි. මගේන් පසු මගේ පුත් කුමරුවාද ඉන් පසු පුත් කුමරුවාගේ පුත් කුමරුවාද ආදී වශයෙන් ඉර හඳ පවතින තාක් මේ මහා රාජ ධුරය දරන්නේ අපි පමණක් බව දැනගනු. හ්ම් වහාම රජවාසලින් පිටව යනු."

"ආනේ... මහ රජාණන්වහන්සේට විහිළුවක්වත් නොතේරෙන හැටි?"
"ඒ කිව්වේ?"

"අපි විහිළුවක් කළේ. දැන් අන්දරෙත් නැති නිසා. ඔබතුමා හැර කවුද රජකමට සුදුස්සා. අපි සැමදා ඔබ සමඟයි. ජාත්‍යන්තර කුමන්ත්‍රණවලට අපි හසුවෙන්නේ නෑ. මහරජාණන්ට ජයවේවා."
"එතකොට මෙච්චර වෙලාවක් මොනවද තොපි කියව කියව හිටියේ?"

"ඒවට කියන්නේ බයිලා කියලා. සවන පිනන ගායන විශේෂයක්."
"හැබෑට? හරි ශෝක්නේ. මම තොපිට දෙනවා රාජ සම්මානයක්."

"කලාසූරි වගේ එකක්ද රජතුමනි?"

"ඊට වඩා බොහොම වටින එකක්. විචිත්‍ර බයිලා බානක කියලා. ඒ සමඟ චීනෙන් ගෙනාව චීත්ත යාර දෙකහමාරකුත් දෙනවා පීඩිත ජනතාව ඉදිරියට යන කොට පටලවගෙන යන්න. හොඃ හොඃ හොඃ"

**මරා සාද්**

